# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk |
| ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk | | |


| | | | |
|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1840 / 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 திக |
| දිනය<br>Date | 13/12/2024<br>පැය 0600 | | |

**මාධ්‍ය නිවේදනය**

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරීම.**

**01. මනුෂ්‍ය ඝාතනයක් - දුම්මලසූරිය පොලිස් වසම.**

2024.12.12 වන දින උදෑසන කාලයේදි දුම්මලසූරිය පොලිස් වසමේ සියඹලගස්රුප්ප ප්‍රදේශයේදී පුද්ගලයෙකු ඝාතනය කර ඇති බවට දුම්මලසූරිය පොලිසියට ලද පැමිණිල්ලක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 39 ක් වූ බටහිර සියඹලගස්රුප්ප, දුම්මලසූරිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

තියුණු ආයුධයකින් ගෙල කපා මෙම ඝාතනය සිදු කර ඇති බවට විමර්ශණයේදී අනාවරණය වී ඇති අතර ඝාතනයට හේතුව හා සැකකරුවන් මෙතෙක් අනාවරණය වී නොමැත. මෘත ශරීරය මහේස්ත්‍රාත් පරීක්ෂණයෙන් පසු කුලියාපිටිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. දුම්මලසූරිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**02. මනුෂ්‍ය ඝාතනයක් - වරකාපොල පොලිස් වසම.**

2024.12.12 වන දින රාත්‍රී කාලයේ වරකාපොල පොලිස් වසමේ මායින්නොලුව ප්‍රදේශයේදී පුද්ගලයෙකු සැකකටයුතු ලෙස මියගොස් ඇති බවට වරකාපොල පොලිසියට ලද පැමිණිල්ලක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 63 ක් වූ මායින්නොලුව, දොරවක ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

දෙදෙනෙකු අතර සිදුවූ බහින් බස්වීමක් දුරදිග යාමෙන් ගලකින් පහරදී මෙම ඝාතනය සිදුකර ඇති බවට පොලිසිය සිදුකල විමර්ශනයේදී අනාවරණය වී ඇත.

මෘත ශරීරය සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් පරීක්ෂණය සිදු කිරීමට නියමිතව ඇත. වයස අවුරුදු 74ක් වන සැකකරු අත්අඩංගුවට ගෙන ඇති අතර වරකාපොල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**03.** **මනුෂ්‍ය ඝාතනයකට සම්බන්ධ සැකකරුවෙකු අත්අඩංගුවට - ඉමදූව පොලිස් සථානය.**

2024.12.11 වන දින රාත්‍රී කාලයේ ඉමදූව පොලිස් වසමේ දික්කුඹුර ප්‍රදේශයේදී පුද්ගලයෙකුට තියුණු ආයුධයකින් පහරදී ඝාතනය කිරීමේ අපරාධයට සම්බන්ධ සැකකරු 2024.12.12 වන දින ඉමදූව පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 74 ක් වන දික්කුඹුර, ඉමදූව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ඉමදූව පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**04.** **මනුෂ්‍ය ඝාතනයකට සම්බන්ධ සැකකරුවෙකු අත්අඩංගුවට - මදුරන්කුලිය පොලිස් සථානය.**

2024.12.10 වන දින අළුයම් කාලයේ මදුරන්කුලිය පොලිස් වසමේ වජිරවත්ත ප්‍රදේශයේදී පුද්ගලයෙකුට පොල්ලකින් පහරදී මනුෂ්‍ය ඝාතනයක් සිදු කිරීමේ අපරාධයට සම්බන්ධ සැකකරු 2024.12.12 වන දින මදුරන්කුලිය පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 28 ක් වන මදුරන්කුලිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මදුරන්කුලිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**05.** **අයිස් මත්ද්‍රව්‍ය හා හෙරොයින් සමඟ සැකකරුවන් සිව් දෙනෙකු අත්අඩංගුවට - කහතුඩුව පොලිස් ස්ථානය.**

2024.12.12 වන දින රාත්‍රී කාලයේ කහතුඩුව පොලිස් වසමේ මූනමලේවත්ත ප්‍රදේශයේදී කහතුඩුව පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් සැකකටයුතු ත්‍රීරෝද රථයක් පරීක්ෂා කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 140 ක්** සමඟ සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 22 හා 25 යන වයස්වල පසුවන නුගේගොඩ හා කිරුළපන ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

අත්අඩංගුවට ගත් සැකකරුවන්ගෙන් අනාවරණය කර ගත් තොරතුරු මත මූනමලේවත්ත ප්‍රදේශයේ නිවසක් පරීක්ෂා කර **අයිස් කිලෝග්‍රෑම් 01 ග්‍රෑම් 50ක් හා හෙරොයින් ග්‍රෑම් 835ක් සමග තවත් සැකකරුවෙකු** අත් අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් එම සැකකරු වයස අවුරුදු 25 ක් වන කිරුළපන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කහතුඩුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 06. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පැලියගොඩ පොලිස් ස්ථානය.

2024.12.12 වන දින රාත්‍රී කාලයේ පැලියගොඩ පොලිස් වසමේ වැල්ඩිස්වත්ත ප්‍රදේශයේදී පැලියගොඩ පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 500 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 27 ක් වන පැලියගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පැලියගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 07. හෙරොයින් සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - පැලියගොඩ කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.

2024.12.12 වන දින සවස් කාලයේ පැලියගොඩ පොලිස් වසමේ නවලෝක වටරවුම අසලදී පැලියගොඩ කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් සැකකටයුතු ත්‍රීරෝද රථයක් පරික්ෂා කර **හෙරොයින් ග්‍රෑම් 100 මිලිග්‍රෑම් 720 ක් හා ජංගම දුරකතන 03ක්** සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන පැලියගොඩ පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 25 හා 28 යන වයස්වල පසුවන ජාඇල ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

පැලියගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 08. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - බොරැල්ල පොලිස් ස්ථානය.

2024.12.12 වන දින උදෑසන කාලයේ බොරැල්ල පොලිස් වසමේ සීවලී ක්‍රීඩාංගනය අසලදී බොරැල්ල පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 106 ක් සහ මත්ද්‍රව්‍ය ජාවාරමෙන් උපයාගත් බවට සැකකරන මුදල් රුපියල් 145,000/=ක්** සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 23 ක් වන කොළඹ 10 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

බොරැල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 09. හෙරොයින් සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - ගල්කිස්ස පොලිස් ස්ථානය.

2024.12.12 වන දින ගල්කිස්ස පොලිස් වසමේ රත්මලාන ධර්මාරාම පාර හා අත්තිඩිය යන ප්‍රදේශවලදී ගල්කිස්ස පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරු මත වැටලීම් 02ක් සිදු කර **හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 800 ක්** හා **හෙරොයින් ග්‍රෑම් 06 මිලිග්‍රෑම් 500 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 37 හා 43 යන වයස්වල පසුවන ගල්කිස්ස හා මඩපාත ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**10. වන අලියෙකු ලොරි රථයකට පහරදීම හේතුවෙන් එම රථයේ සිටි කාන්තාවක් මියයාම - ගෝනගංආර පොලිස් වසම.**

2024.12.12 වන දින උදෑසන කාලයේ ගෝනගංආර පොලිස් වසමේ බුත්තල කතරගම මාර්ගයේ යාල රක්ෂිතය මැදින් වැටී ඇති කොටසේ කිලෝමීටර් 36 ත් 37 ත් අතර ප්‍රදේශයේදී වන අලියෙකු මාර්ගයේ ගමන් කල ලොරි රථයකට පහරදී ලොරි රථය පෙරලා ඇත. එම ලොරි රථයේ ඉදිරිපස අසුනේ ගමන් කල කාන්තාවක් ලොරි රථයට යටවීමෙන් බරපතල තුවාල ලබා බුත්තල රෝහල වෙත ඇතුලත් කිරීමේදී මියගොස් ඇත

**මරණකාරිය වයස අවුරුදු 66 ක් වූ ධීවර ගම්මානය, සියඹලාආණ්ඩුව ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය බුත්තල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර, ගෝනගංආර පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**11. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කුඹුක්ගැටේ පොලිස් ස්ථානය.**

2024.12.12 වන දින දහවල් කාලයේ කුඹුක්ගැටේ පොලිස් වසමේ රිදීගම ප්‍රදේශයේදී කුඹුක්ගැටේ පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 52 ක් වන වඩුවාව, කුඹුක්ගැටේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කුඹුක්ගැටේ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**12. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පිටිගල පොලිස් ස්ථානය.**

2024.12.12 වන දින සවස් කාලයේ පිටිගල පොලිස් වසමේ අමුගොඩ ප්‍රදේශයේදී පිටිගල පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 43 ක් වන අමුගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පිටිගල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**13. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මහවිලච්චිය පොලිස් ස්ථානය.**

2024.12.12 වන දින දහවල් කාලයේ මහවිලච්චිය පොලිස් වසමේ යාය 07 ප්‍රදේශයේදී මහවිලච්චිය පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 29 ක් වන අමුගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මහවිලච්චිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

14. **මාරක රිය අනතුරක් - පිටිගල පොලිස් වසම.**

2024.12.12 වන දින දහවල් කාලයේ පිටිගල පොලිස් වසමේ ඇල්පිටිය පිටිගල මාර්ගයේ තලගස්පේ ප්‍රදේශයේදී ඇල්පිටිය දෙස සිට පිටිගල දෙසට ධාවනය වූ පුද්ගලික බස් රථයක් බස් නැවතුමේ මගීන් බැස්සවීමෙන් පසු නැවත ගමන් කිරීමේදී එම බස් රථයේ දකුණු පිටුපස රෝදයට පදික කාන්තාවක් යටවීමෙන් අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පදික කාන්තාව ඇල්පිටිය රෝහලට ඇතුලත් කර ප්‍රතිකාර ලබමින් සිටියදී මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 64 ක් වූ ගලගස්පේ ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය ඇල්පිටිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර අනතුර සම්බන්ධයෙන් බස් රථ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. පිටිගල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

15. **මාරක රිය අනතුරක් - හබරණ පොලිස් වසම.**

2024.12.12 වන දින දහවල් කාලයේ හබරණ පොලිස් වසමේ හබරණ දඹුල්ල ප්‍රධාන මාර්ගයේ හබරණ නගරයේදී දඹුල්ල දෙස සිට හබරණ දෙසට ධාවනය වූ කැබ් රථයක පදික මාරුවක් මතින් ගමන් කල කාන්තාවක් ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පදික කාන්තාව හබරණ රෝහලට ඇතුලත් කර ප්‍රතිකාර ලබමින් සිටියදී මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 56 ක් වූ එප්පාවල ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය හබරණ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර අනතුර සම්බන්ධයෙන් කැබ් රථ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. හබරණ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

16. **මාරක රිය අනතුරක් - මොරගොඩ පොලිස් වසම.**

2024.12.12 වන දින උදෑසන කාලයේ මොරගොඩ පොලිස් වසමේ මුරියාකඩවල අල්ලිස්ථාන අතුරු මාර්ගයේ කට්ටමුරිච්චාන ප්‍රදේශයේදී මුරියාකඩවල දෙස සිට අල්ලිස්ථාන දෙසට ධාවනය වූ ලොරි රථයක් ප්‍රතිවිරුද්ධ දෙසින් පැමිණි යතුරුපැදියක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ යතුරුපැදිකරු අනුරාධපුරය රෝහලට ඇතුලත් කර ප්‍රතිකාර ලබමින් සිටියදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 47 ක් වූ ලබුනෝරුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය අනුරාධපුරය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර අනතුර සම්බන්ධයෙන් ලොරි රථ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. මොරගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

17. **රිය අනතුරක් - නිට්ටඹුව පොලිස් වසම.**

2024.12.12 වන දින සවස් කාලයේ නිට්ටඹුව පොලිස් වසමේ කොළඹ නුවර ප්‍රධාන මාර්ගයේ කලල්පිටිය ප්‍රදේශයේදී කොළඹ දෙස සිට කඳුරුවෙල දෙසට ධාවනය වූ බස් රථයක් ප්‍රතිවිරුද්ධ දෙසින් පැමිණි වෑන් රථයක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ වෑන් රථයේ රියදුරු, කාන්තාවන් තිදෙනෙකු, පිරිමි පුද්ගලයින් දෙදෙනෙකු හා බස් රථයේ රිය සහයක තුවාල ලබා වතුපිටිවල රෝහලට ඇතුලත් කර ප්‍රතිකාර ලබමින් සිටී.

**වෑන් රථයේ ගමන් කල තුවාලකරුවන් අවුරුදු 44, 54, 57 හා 64 යන වයස්වල පසුවන නිට්ටඹුව ප්‍රදේශයේ පදිංචිකරුවන් වන අතර බස් රථයේ රිය සහයක පොල්පිතිගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

බස් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර නිට්ටඹුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කර ගෙන යනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**